ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**

| | | | |
|---|---|---|---|
| මගේ අංකය My Number | USJP/EEX-06/2025 | ලිපිනය Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල Post Box 10, Gangodawila නුගේගොඩ, ශ්‍රී ලංකා Nugegoda, Sri Lanka , |
| ඔබේ අංකය Your Number | | | |
| දුරකථනය Telephone | 011-2801481, 0113-485402 | වෙබ් අඩවිය Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස් Fax | 011-2802753 | විද්‍යුත් තැපැල E-mail | exams.edecu@sjp.ac.lk |


2025.10.27

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි

**පුනර් අපේක්ෂකයින් සඳහා විභාග අයදුම්පත් කැඳවීම - 2025**

**විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි II පරීක්ෂණය (නව විෂය නිර්දේශය) 2017/2018/2019/2020/2021/2022 කණ්ඩායම් සඳහා**

**01.** ඉහත පුනර් පරීක්ෂණයට අයදුම් කිරීමට සහ පරීක්ෂණ ගාස්තු ගෙවීමට පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වා සිටිමි.

02.

| | |
|---|---|
| පුනර් පරීක්ෂණ අයදුම්පත සහ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය | ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස Examination හි ඇති Application **වෙත පිවිස අයදුම්පත ලබා ගත හැකිය. පරීක්ෂණ ගාස්තු** ගෙවීම සඳහා ඔබට අදාල ගිණුම් අංකය ඔබගේ තොරතුරු ගොනුව **(Student Profile)** වෙත පිවිස **(Student)** හි ඇති **Payments** මගින් ලබා ගත හැක. **ඕනෑම මහජන බැංකු ශාඛාවකින් හෝ මාස්ටර්/වීසා (Master/ Visa) (Credit හෝ Debit Card) මගින් ගෙවීම් කළ හැක.** |
| **පුනර් පරීක්ෂණ ගාස්තු** | විෂයයන් 1ක් සඳහා රු. 5,000.00<br>විෂයයන් 2ක් සඳහා රු. 7,000.00<br>විෂයයන් 3ක් සඳහා රු. 9,000.00<br>විෂයයන් 4ක් සඳහා රු. 11,000.00<br>විෂයයන් 5ක් සඳහා රු. 13,000.00<br>විෂයයන් 6ක් සඳහා රු. 15000.00 |
| 2025 මාර්තු/අප්‍රේල් පවත්වන ලද උපාධි II පරීක්ෂණයට අයදුම් කර වෛද්‍ය හේතු මත විභාගයට වරප්‍රසාද ලැබූ 2022 වර්ෂයේ ලියාපදිංචි අපේක්ෂකයන්ද පරීක්ෂණ ගාස්තු ගෙවීම අනිවාර්ය වේ. | |
| අයදුම්පත් යොමු කිරීම | ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස ලබා ගන්නා අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමුකළ (Apply) යුතු වේ. මාර්ගගත ක්‍රමවේදය හරහා අයදුම්පත් යොමුකළ (Apply) පසු ඔබ ඉල්ලුම් කළ පුනර් පරීක්ෂණයට අදාළ තොරතුරු Student Profile හරහා පරීක්ෂා කළ හැක. |
| අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය | **2025 නොවැම්බර් 17 (රාත්‍රී 12.00 දක්වා)** |

03.

<table>
<tr><th><u>ලියාපදිංචිය දීර්ඝ කිරීම</u></th><td rowspan="6">ලියාපදිංචිය දීර්ඝ කිරීම පිලිබඳ විස්තර www.external.sjp.ac.lk වෙබ් අඩවියේ සහ ඒ සඳහා මුදල් ගෙවිය යුතු ගිණුම් අංකය (Student Profile) වෙත පිවිස (Student) හි ඇති Payments මගින් ලබා ගත හැක. ඕනෑම මහජන බැංකු ශාඛාවකින් හෝ මාස්ටර්/වීසා (Master/ Visa) (Credit හෝ Debit Card) මගින් ගෙවීම් කළ හැක. (ගෙවීම් කරන ලද රිසිට් පත සහ ශිෂ්‍ය වාර්තා පොත තැපැල් මගින් එවීම අවශ්‍ය නොවේ)</td></tr>
<tr><td>2017 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2024-09-30 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>(ලියාපදිංචිය වාර 4 ක් අලුත් කර තිබිය යුතුය)</td></tr>
<tr><td>2018 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2024-09-30 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>(ලියාපදිංචිය වාර 3 ක් අලුත් කර තිබිය යුතුය)</td></tr>
<tr><td>2019 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2024-08-31 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>(ලියාපදිංචිය වාර 2 ක් අලුත් කර තිබිය යුතුය)</td></tr>
<tr><td>2020 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2024-08-31 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>(ලියාපදිංචිය වාර 1 ක් අලුත් කර තිබිය යුතුය)</td></tr>
<tr><td>2021 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2026-01-31 දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>(ලියාපදිංචිය වාර 1 ක් අලුත් කර තිබිය යුතුය)</td></tr>
</table>

**සැලකිය යුතුයි**

I. **2017 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි සිසුන් හට උපාධි 2 පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැකි අවසන් අවස්ථාව මෙය වේ .**

II. <u>පරීක්ෂණ අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම පාඨමාලා ගාස්තු දෙවන හා තෙවන වාරිකය ද අදාළ පරිදි ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ගාස්තුද සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. එසේ ගෙවා නොමැති අයදුම්පත් නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>

III. අයදුම්පත් යොමු (Apply) කිරීමේ අවසන් දිනය 2025/11/17 **(රාත්‍රී 12.00 දක්වා)** වන අතර එම දිනයෙන් පසුව කිසිදු හේතුවක් මත අයදුම්පත් භාරගනු නොලැබේ.

IV. පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවෙකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. ගාස්තු ගෙවීම, දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් සිදුකළ හැක. (ගෙවීම් කරන ලද රිසිට් පත ළග තබාගත යුතු අතර වෙනත් ගිණුම් අංක වලට ගෙවන ලද මුදල් පිළිබඳව විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ.)

V. නියමිත පරිදි මුදල් නොගෙවන ලද අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VI. පරීක්ෂණයට අදාළ කාල සටහන **www.external.sjp.ac.lk** යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියළු දැනුවත් කිරීම් වෙබ් අඩවිය/ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) හරහා පමණක් සිදු වේ.

VII. විදේශ ගත සිසුන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පෙනී සිටිය හැක. ඒ සඳහා වන විස්තර **<u>http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/</u>** යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

VIII. නියමිත දිනට ඉහත පරීක්ෂණය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශපත්‍රය ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස Examination හි ඇති Admission වෙත පිවිස බාගත Download කර ගත හැක. විභාග ප්‍රවේශපත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න.

IX. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය 428 වන සනාතන සභාව විසින් අනුමත කරන ලද සංශෝධිත නව විභාග නීති රීති මාලාව **external.sjp.ac.lk/bachelor-of-science-management-public-general-external-degree-exam-rules-and-regulations/** වෙත පිවිස පරිශීලනය කල හැක.

X. **උපාධියක් සම්පූර්ණ කිරීම :** උපාධිය ලැබීම සඳහා අවශ්‍යතාවන් පිළිබද විස්තර **www.external.sjp.ac.lk** වෙබ් අඩවියේ පල කර ඇති ඔබගේ අධ්‍යයන වර්ෂයට අදාළ ශිෂ්‍ය විවරණිකාව (Prospectus) පරිශීලනය කිරීමෙන් ඔබට ලබා ගත හැකිය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025-10-27